**ශීර්ෂය - 182 විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය**

**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

-----------------------------------------------------------------

## 1.1 විගණන විෂය පථය

---------------------

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 25 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

-----------------------------------------------------------------------------

විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණය

----------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**-----------------------------------------------**

අමාත්‍යාංශය විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

**(ආ) විසර්ජන ගිණුම**

**--------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) මුළු ප්‍රතිපාදනය හා වියදම**

**----------------------------**

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.424,235,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.402,290,493 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.21,944,507 ක් හෙවත් සියයට 5ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

2013 දෙසැම්බර් 31 දිනට

| වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 199,235,000 | 197,344,718 | 1,890,282 | 1 |
| මූලධන | 225,000,000 | 204,945,775 | 20,054,225 | 9 |
| එකතුව | 424,235,000 | 402,290,493 | 21,944,507 | 5 |

**(ii) අයවැය විචලනය**

**--------------------**

වැය විෂයයන් 06 ක් සඳහා සළසා තිබුණු රුපියල් මිලියන 11.5 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාලව රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 18201 | 4,000,000 | 3,185,465 | 1,100,000 | 2,324,548 | 8,000,000 | 6,063,633 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

- විෂය අංක 18201 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.71,360 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 1.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 1.4.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකය 2013 නොවැම්බර් 06 දින සිට ස්ථාපනය කර තිබූ නිසා 2013 වර්ෂය සඳහා ප්‍රමාණවත් විගණනයක් සිදු කර නොතිබුණි.

### 1.4.2 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජ්/2009(I) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 6 වන ඡේදය අනුව විගණන හා කළමනාකරණ කමිටුව අවම වශයෙන් මාස 03කට වරක් රැස්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

**1.5 වත්කම් කළමනාකරණය**

---------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

අමාත්‍යාංශයට අයත් මෝටර් රථයක් 2011 සැප්තැම්බර් 28 දින සිට ඌන උපයෝජිතව පැවති අතර 2013 ජනවාරි 05 වන දිනෙන් පසු භාවිතයට ගෙන නොතිබුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

------------------------------------------

අමාත්‍යාංශය සතු ඩබල් කැබ් රථයක් මහා මාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය වෙත ලබා දී තිබූ අතර එසේ භාර දුන් දිනය හෝ එම කැබ් රථයේ වටිනාකම පිළිබඳ තොරතුරු අමාත්‍යාංශය සතුව නොතිබුණි.

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

----------------------------------------------------------------

ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය විසින් කුලියට ලබා ගෙන තිබුණු වාහන දෙකක් අමාත්‍යාංශය විසින් භාවිතයට ගෙන තිබුණු අතර 2013 දෙසැම්බර් 31 දිනට එම වාහන සඳහා ගෙවා තිබූ කුලිය රු.1,638,499 ක් වී තිබුණි.

**1.6 අනුකූල නොවීම.**

**------------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**--------------------------------------------------**

නියැදි විගණන පරික්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 66 (i) | අධිකාරි බලය ලැබීමට පෙර පිළිවෙලින් රු.384,224 ක් හා රු.1,879 ක් වශයෙන් එකතුව රු.386,103 ක වියදම් සඳහා ගෙවීම් කර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1646 | අමාත්‍යාංශය සතු වාහනයකට අදාල මාසික සංසිද්ධි වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) චක්‍රලේඛ | |
| (i) 2010 මැයි 14 දිනැති CA/1/17/1 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛය | |
| 3.1 ඡේදය | ගරු අමාත්‍යවරයාට පරිහරණය කළ හැකි උපරිම නිලවාහන සංඛ්‍යාව 03 ක් වුවත්, ඊට පටහැනිව අමාත්‍යවරයා වෙත වාහන 04 ක් පරිහරණය සඳහා ලබා දී තිබුණි. |

| | |
|---|---|
| 4: 2 ඡේදය | ඉන්ධන දීමනාව මාසික දීමනාවක් ලෙස ගෙවිය යුතු වුවත්, ඊට පටහැනිව අමාත්‍යවරයාගේ පාවිච්චිය සඳහා ලබා දී තිබූ වාහන 04 ක් සඳහා මාසිකව රු.200,000 ක කූපන් පත්වලට ඉන්ධන ලබා දී තිබුණු අතර ඉදිරි මාස සඳහා ද ඉන්ධන කූපන් පත් මිලදී ගෙන තිබුණි. |
| (ii)1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | |
| 2.11 උප ඡේදය | මාස 06 කට වරක් වාහනවල ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදු කළ යුතු වුවත්, එවැනි පරීක්ෂාවක් අමාත්‍යාංශය විසින් සිදු කර නොතිබුණි. |

**1.7 මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 08 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 01 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1213 | 965 | 248 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 26 | 22 | 04 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 04 | 01 | 03 |
| | එකතුව | 1253 | 997 | 256 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 256 ක් පිරවීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.

**(ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

**-------------------------------------------------------**

අමාත්‍යාංශය විසින් ලබාගත් මානව සම්පත් පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | කාලපරිච්ඡේදය |
|---|---|---|---|
| පොදු සහකාර | 02 | විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 2013 වර්ෂයේදී |
| රියදුරු | 02 | | |
| කාර්ය පැවරුම් අනුව කාර්යාල කාර්ය සහායක | 01 | | |
| | 01 | | |